විශිෂ්ටයන්ගේ අතිවිශිෂ්ටයන් බිහිකරන පාඩම් මාලාව **12**

බුද්ධි කලම්බනයක නවමු මඟ

ශ්‍රී ලංකා පරිපාලන සේවා විවෘත තරග විභාගය

මෙම පාඩම් මාලාව පහත සඳහන් විෂයයන් හතරම ආවරණය කරනු ලබයි. සාමාන්‍ය බුද්ධිය, සාමාන්‍ය දැනීම, රචනය හා සාරාංශය, කළමනාකරණ අභියෝගතාවය, මෙම විෂයයන් ප්‍රශ්න පත්‍ර හතරක් ලෙසින් පහත පරිදි විභාගයට ලැබේ.
සාමාන්‍ය බුද්ධිය කාලය පැය 1 යි - බහුවරණ ප්‍රශ්න 50 යි ලකුණු 100යි
සාමාන්‍ය දැනීම කාලය පැය 2යි බහුවරණ 50 යි, ව්‍යුහගත 25 යි ලකුණු 100යි
රචනය හා සාරාංශය කාලය පැය 2 යි රචනය වචන 200යි, සාරාංශයක් ලැබූ ලකුණු 100යි.
කළමනාකරණ අභියෝගතාවය කාලය පැය 2 යි බහුවරණ 50යි ව්‍යුහගත 25 යි ලකුණු 100 යි.

සාමාන්‍ය බුද්ධිය - 3

(1) ගීතා, බන්දුල, නිමල් හා බුද්ධි උපාධිධාරීහු. ගීතා, රංජිත් හා නිමල් විවාහකයෝය. බන්දුල, බුද්ධි හා නිමල් නිවාස නිමිකරුවෝ වන අතර බන්දුල හැර සෙසු නිවාස නිමිකරුවන්ට මෝටර් රථ ඇත. ගීතා-ටද මෝටර් රථයක් ඇත.
(01) මෝටර් රථයක් ඇති අවිවාහක උපාධිධාරියා කවුද ?
(02) මෝටර් රථයක් නොමැති විවාහකයා කවුද ?
(03) නිවාසයක් අතිමි උපාධිධාරියා කවුද ?
(04) බුද්ධිගේ අනාගත සහකරු මෙම කණ්ඩායමේ ම අයෙකි. ඔහු කවුද ?

(2) අජිත්, මංගලිකා, මතකුංශ, අමල්, රංජිත්, අනෝමා, රංජනී, මංජුලා, යන නිලධාරි නිලධාරිණි-යන්ගේ මංගලිකා හා මතකුංශ අවිවාහකයෝය. අමල්, රංජිත් හා මංගලිකාට මෝටර් රථ ඇත. අජිත්, අනෝමා, මංජුලා හා මතකුංශ හැර සෙසු අය නිවාස නිමිකරුවෝය. අජිත්, අනෝමා, රංජිත් හා මතකුංශ ශ්‍රී ලංකා පරිපාලන සේවා සීමිත තරග විභාගයටද පෙනී සිට ඇත.

(1) පරිපාලන සේවා විභාගයට පෙනී සිටි අවිවාහකයා කවුද ?
(2) පරිපාලන සේවා සීමිත තරග විභාගයට පෙනී නොසිටි මෝටර් රථයක් හා නිවාසයක් හිමි විවාහ-කයා කවුද ?
(3) මෝටර් රථයක් හිමි අවිවාහකයා නිවාස හිමිකරුවෙක්ද ?
(4) මෝටර් රථයක් හා නිවාසයක් හිමි පරිපාලන සේවා සීමිත තරග විභාගයට පෙනී සිටි විවාහකයා කවුද ?
(5) නිවාස අතිමි විවාහකයින්ගේ පරිපාලන සේවා සීමිත තරග විභාගයට පෙනී සිටි අය කවුද ?
(6) නිවාස හිමි කී දෙනෙක් පරිපාලන සේවා සීමිත තරග විභාගයට පෙනී සිටියාද ?

(3) අමල්, අනිල්, අජිත්, අසංක, අසේලු, අසිත හා අනීත යහළුවෝය. අමල්, අනිල්, අජිත්, අනීත හා අසංක කීකරුය. අජිත්, අසංක, අසේලු හා අසිත අවංකය. අසංක, අමල්, අසිත, හා අනීත දක්ෂය. අමල්, අනිල්, අසංක හා අනීත ආගමට ලැදිය. ආග-මට ලැදි සියලුම දෙනා හා අසේලු නිහතමානීය.
(1) කීකරු, ආගමට ලැදි නිහතමානී යන ගුණාංග පමණක් ඇති අය කවුද ?
(2) කීකරු, දක්ෂ, ආගමට ලැදි නිහතමානී ගුණාංග පමණක් ඇති අයවලුන් කවුද ?
(3) අවංක හා දක්ෂ යන ගුණාංග පමණක් ඇති අය කවුද ?
(4) කීකරු, අවංක, දක්ෂ, ආගමට ලැදි නිහතමානී පුද්ගලයා කවුද ?
(5) අවංක නැති දක්ෂ අයවලුන් කවුද ?
(4) A, B, C, D, E, F, G හා H යනු ලිපි ගොනු අටකි. A හා D නිල් පාටය. C, F, හා H කොළ පාටය. සෙසු ඒවා රතු පාටය. A, F හා D සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතුය. C, G හා B සඳහා ලේකම්ගේ අනුමැතිය ප්‍රමාණවත්ය. සෙසු ලිපිගොනු අනුමත කිරීමේ බලය කොමසා-රිස්වරයාට ඇත. A, E හා F යනු ඉඩම් සම්බන්ධ ගොනු වන අතර D, H හා G ටෙන්ඩර් කැඳවීම සම්බන්ධය. සෙසු ගොනු පත් කිරීම් වලට අදාළ වේ.
(1) අමාත්‍යවරයාගේ අනුමැතිය ගත යුතු කොළ පාට ගොනුව කුමක කැරුණක් සඳහා වුවක්ද ?
(2) පත් කිරීම්වලට අදාළ රතු පාට ගොනුව අනු-මත කළ යුත්තේ කවුරු විසින්ද ?
(3) අමාත්‍යවරයා අනුමත කළ යුතු ටෙන්ඩර් සම්බන්ධ ගොනුව කුමක්ද ?
(4) ලේකම්වරයා විසින් අනුමත කළ යුතු කොළ පාට ගොනුව කුමක කැරුණක් පිළිබඳ වුවක්ද ?
(5) කොමසාරිස්වරයාට අනුමත කිරීමට බලය ඇති ඉඩම් පිළිබඳ ගොනුව කුමක්ද ?

(5) A, B, C, D, E, F, G, H, I හා J යනු ඛැංකු-වක ලිපි ගොනු දහයකි. A, E හා H නිවාස හා දේපළ ණය ද, C, F හා G යනු වාහන ණය ද, සෙසු ලිපි ගොනු වෙළඳ ණය ද සම්බන්ධිත ගොනු වේ. ඒ, F හා D ගොනු රතු පාටය. C, H හා I යන ගොනු නිල් පාටය. සෙසු ගොනු කොළ පාටය. ඛැංකු කළ-මනාකරුට E, C, B හා I යන ගොනු අනුමත කිරී-මට බලය ඇත. A, G හා J ගොනුවලට දීප්තීන් කළමනාකරුගේ අනුමැතිය අවශ්‍ය වන අතර සෙසු ගොනු අනුමත කිරීමේ බලය පළාත් කළමනාකරුට ඇත.
(1) ඛැංකු කළමනාකරුට අනුමත කිරීමේ බලය ඇති වෙළඳ ණය සම්බන්ධිත කොළ පාට ගොනු කුමක්ද ?
(2) දීප්තීන් කළමනාකරුට අනුමත කිරීම සඳහා ඉදිරිපත් වූ රතු පාට ගොනුව කුමක්ද ? එය කුමන කැරුණක් සඳහා වුවක්ද ?
(3) දීප්තීන් කළමනාකරුගේ මේසය මත තිබි වාහන ණය පිළිබඳ ගොනුවන් අස්ථාන ගතවී ඇත. එම ගොනුව කුමක්ද ?
(4) ඛැංකු කළමනාකරුට අනුමත කිරීමට ඉදිරි-පත් වූ වාහන ණය පිළිබඳ ගොනුව කුමක්ද ?
(5) පළාත් කළමනාකරුට අනුමත කළ හැකි නිල් පාට ගොනුව කුමක්ද ? එය කුමන කැරුණක් සඳහා වුවක්ද ?

(6) කමලා, විමලා හා ඕලා, පරිපාලකයකු, ඉංජිනේරුවකු සහ වෛද්‍යවරයක (පිළිවෙළින් නොව) සමග විවාහ ගිවිස ගෙන ඇත. මහාලයන්ගේ නම් (පිළිවෙළින් නොව) සම්පත් දර්ශන හා මලින්-දය. සම්පත් පරිපාලකයාය. විමලාගේ ගිවිසුම ඉංජිනේරුවා සමග නොවේ.
වෛද්‍යවරයාගේ අනාගත සහකාරිය ඕලා නොවන්නීය. දර්ශන හා කමලා විවාහ ගිවිසගෙන ඇත්තේ ප්‍රේමය සබඳතාවක් උඩය. මලින්ද ඉංජිනේ-රුවාය.
i. කමලාගේ අනාගත සැමියා..... ය.
ii. ඔහු වෘත්තියෙන් ..... ය.
iii. විමලාගේ අනාගත සැමියා ..... ය.
iv. ඔහු වෘත්තියෙන් ..... ය.
v. ඕලාගේ අනාගත සැමියා ..... ය.
vi. ඔහු වෘත්තියෙන් ..... ය.

(7) රුසියාව, චීනය, යුගෝස්ලාවියාව, කියුබාව හා ලිබියාව යන රටවල් පහේ ජාතික කොඩි වල පිංතූර A, B, C, D, E යන ළමුන් පස් දෙනෙකුට ඉදිරිපත් කර ඒවා හඳුන්වන ලෙස නියම කරන ලදී. ජාතික කොඩි පහ 1, 2, 3, 4, 5 (පිළිවෙළින් නොව) අංකනය කරන ලදී. හැම ශිෂ්‍යයෙක්ම 2 ක් පමණක් නිවැර-දිව හැඳින්විය. එසේම සෑම ජාතික කොඩියක්ම දෙදෙනෙකු විසින් නිවැරදිව නම් කරන ලදී. එම නම් කිරීම මෙසේ වේ.
A : 1. ලිබියාව 2. රුසියාව
3. යුගෝස්ලාවියාව 4. කියුබාව 5. චීනය
B : 1. යුගෝස්ලාවියාව 2. කියුබාව
3. රුසියාව 4. චීනය 5. ලිබියාව
C : 1. රුසියාව 2. ලිබියාව
3. චීනය 4. කියුබාව 5. යුගොස්ලාවියාව
D : 1. යුගෝස්ලාවියාව 2. රුසියාව
3. කියුබාව 4. ලිබියාව 5. චීනය
E : 1. රුසියාව 2. කියුබාව
3. චීනය 4. යුගෝස්ලාවියාව 5. ලිබියාව
i. අංක 1 ..... ජාතික කොඩියකි
ii. අංක 2 ..... ජාතික කොඩියකි
iii. අංක 3 ..... ජාතික කොඩියකි
iv. අංක 4 ..... ජාතික කොඩියකි
v. අංක 5 ..... ජාතික කොඩියකි

(8.) පිනාට ජීවිතයේ පළමු වරට තැපෑලෙන් ලීයු-මක් ලැබිණි. එහෙත් ඔහු කියවීමට හෝ ලිවීමට නොදන්නෙකි. එසේ වුවත් පිළිතුරු ලිවියක් යැවීමට ඔහුට සිතුණි. ඔහුට මිතුරෝ තිදෙනෙක් සිටියහ. තිදොනාම උගත්ය. එහෙත් එක් අයෙක් කිතිරිය. දෙවැන්නා අත්ධය. තුන්වැන්නා ගොළය. ලැබූ ලිපිය කියවා සාර්ථක පිළිතුරක් යැවීමට පිනා විසින් ලබාගත යුත්තේ කාගේ ආධාරයද ?
1. ගොළු තැනැත්තාගේ
2. අන්ධ තැනැත්තාගේ
3. කිතිරි තැනැත්තාගේ
4. කිතිරි තැනැත්තාගේ හා ගොළු තැනැත්තාගේ
5. අන්ධ තැනැත්තාගේ හා ගොළු තැනැත්තාගේ
6. කිතිරි තැනැත්තාගේ හා අන්ධ තැනැත්තාගේ

(9) සරත්, දිනේෂ්, හා ජගත් පාසල් කාලයෙන් පසු මහජන පුස්තකාලයට යමින් සිටියහ. මොවුන්ගෙන් එක් අයෙක් ශ්‍රී පාලි විද්‍යාලයේද එක් අයෙක් මේධංකර විද්‍යාලයේද එක් අයෙක් තක්ෂිලා විද්‍යා-ලයේද ඉගෙනීම ලබති. පුස්තකාලයාධිපති සුනදව ඔවුන්ගෙන් කම විදාලල විමසීය. පුස්තකාලයාධිපති ගේ බුද්ධිය ඛැලීමට සිතූ ඔවුහු මෙසේ පිළිතුරු දුන්හ.
සරත් : මා ඉගෙනගන්නේ ශ්‍රී පාලි විද්‍යාලයේය
දිනේෂ් : මා ඉගෙන ගන්නේ ශ්‍රී පාලි විද්‍යාලයේ නොවේ
ජගත් : මා ඉගෙන ගන්නේ මේධංකර විද්‍යාලයේ නොවේ
අප කීදෙනාගෙන් ඇත්ත කීවේ එක් අයෙක් පමණි. හැකිනම් අප ඉගෙන ගන්නා විද්‍යාල සොයා ගන්න.
1. සරත් ගේ විද්‍යාලය.....
2. දිනේෂ්ගේ විද්‍යාලය.....
3. ජගත්ගේ විද්‍යාලය.....

(10) අනිල්, විමල්, සුනිල්, දිනල් හා පියල් ද එක්-තරා ලොරියක් බසයක් හා කාර් එකක් යන වාහන වලින් එකක හෝ වැඩි ගණනක හෝ අයිතිකාරුවෝ වෙති.
එහෙත් ඔවුහොවුන් අතරින් තවර දෙදෙනකු හෝ එකම වාහන දෙකක අයිතිකාරුවෝ නොවෙති. සුනිල් හා අනිල් ද බසයක අයිතිකාරුවෝය. පළමු-වැනි හතර දෙනාගෙන් එක් අයෙකුට බසයක් පමණක් හා තවන් එක් අයෙකුට කාර් එකක් පමණක්ද අයිතිව ඇති අතර ඔවුන් අතුරින් බසයක් අයිති අයෙකුට ලොරියක්ද අයිතිව ඇත. දිනිල්ට බසය හෝ ලොරිය අයිති නැත.
විමල්ට හා සුනිල්ට ලොරියක්ද තවන් එක් වාහ-නයක්ද අයිතිව ඇත. පියල්ට අයිතිව ඇත්තේ අනිල්ට අයිති එහෙත් විමල්ට අයිති නැති වාහනය හෝ වාහන වේ. එක් එක් අයට අයිති වාහනය හෝ වාහන ලියන්න.
i. අනිල් .....
ii. විමල් .....
iii. සුනිල් .....
iv. දිනිල් .....
v. පියල් .....

මෙම පාඩමේ පිළිතුරු සිකුරාදා (07) පත්‍රයේ පළවේ

මීළඟ පාඩම බදාදා (05) පත්‍රයේ පළවේ

ඉදිරිපත් කිරීම
අනුෂා ගෝකුළ ප්‍රනාන්දු
අධ්‍යක්ෂ
බස්නාහිර පළාත්
සමාජ සේවා දෙපාර්තමේන්තුව

දිනමිණ පුවත්පත ඔබට ලබා ගැනීමේ අපහසුතා ඇත්නම් පුවත්පත් බෙදා හැරීමේ කළමනාකරු, 011 2429371, දුරකථන අංකයට හෝ 011 2429378 සහ 011 2429776 යන දුරකථන අංකයන්ට අමතා හෝ 011 2429470 යන Fax අංකයට දන්වා විස්තර ලබා ගන්න.

© 2010

Web2PDF
converted by Web2PDFConvert.com